


සෙනාරා සිතුම්දි සරත්චන්ද්‍ර

# පුංචි සුරංගනාවී

සෙනාරා සිතුම්දි සරත්චන්ද්‍ර

# පුංචි සුරංගනාවී

කර්තෘ : සෙනාරා සිතුම්දි සරත්චන්ද්‍ර

4 ශ්‍රේණිය C

මහ/ මහාමායා බාලිකා විද්‍යාලය

මහනුවර.

කර්තෘ ප්‍රකාශනයකි.

| | | |
|---|---|---|
| පළමු මුද්‍රණය | : | 2023 |
| පිට කවරය | : | සෙනාරා සිතුම්දි සරත්චන්ද්‍ර |
| ISBN Number | : | 978-624-206-842-8 |

# පිදුම

මාගේ ආදරණීය

පන්ති භාර ගුරුතුමිය වන

ප්‍රියන්ති ජයසේකර ගුරුමෑණියන්ට

ගෞරවයෙන් පුදමි !

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.
මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන්, සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර,

විදුහල්පතිනිය,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

2023 '11 ' 01

සුරංගනා ලෝකේ තියෙන්නේ අහස උඩ. ඒ සුරංගනා ලෝකේ ඉන්නවා හොඳ සුරංගනාවියක් සහ නරක සුරංගනාවියක්. ඒ සුරංගනා ලෝකෙම ඉන්නවා පුංචි සුරංගනාවියක් එයාගේ නම තමයි බෙලා.

හොඳ සුරංගනාවිගේ නම තමයි ලියෝනා,

නරක සුරංගනාවිගේ නම තමයි ෆේඩ්රියා.



දවසක් පුංචි සුරංගනාවී සුරංගනා කැලේ ඇවිදින්න ගියා. එයාට හොඳ සුරංගනාවිගේ පුරුදුත් තිබ්බා, නරක සුරංගනාවිගේ පුරුදුත් තිබ්බා. ඒ හින්දා එයා සත්තුන්ට, සුරංගනාවියන්ට, මිනිස්සුන්ට, ගස් වැල් වලට වද දුන්නා, උදව් කරා.




කැලේට ගියපු මේ පුංචි සුරංගනාවි සත්තුන්ට වද දෙන්න පටන් ගත්තා.



ඒ වෙලාවෙම හොඳ සුරංගනාවි එතනට ආවා. හොඳ සුරංගනාවි එතනට ඇවිත් හොඳ පුරුදු පුංචි සුරංගනාවිට කියලා දුන්නා. එතකොට නරක සුරංගනාවිගේ බලය ටිකෙන් ටික අඩු වුණා. ඒත් නරක සුරංගනාවි මොනවා කරන්න ද? එයාට හොඳටම තරහයි.



එයත් එතනට ගියා. නරක සුරංගනාවි දැක්කා පුංචි සුරංගනාවි හොද සුරංගනාවි එක්ක ඉන්නවා. එයා ඒ වෙලාවේ බලය පාවිච්චි කරන්න හදද්දිම එයාව ගැඹුරු, කළුවර ලොකුම ලොකු වලකට ඇදගෙන වැටුණා. එක දැකපු පුංචි සුරංගනාවි එතනට දුවගෙන ආවා.



පුංචි සුරංගනාවි ලිස්සලා ගිහින් ඒ වලටම වැටුණා. හොඳටම බය වෙච්ච හොඳ සුරංගනාවි එතනට වේගයෙන් දුවගෙන ආවා. කැලේ ඉන්න සියලුම සත්තු එතනට ආවා.



සත්තු ඔක්කොම අත් අල්ලගෙන දම්වැලක් හැදුණා. ඊට පස්සේ එයාලා වල ඇතුළට බැහැලා පුංචි සුරංගනාවියයි, නරක සුරංගනාවියයි බේර ගත්තා.



ඊට පස්සේ හොඳ සුරංගනාවි එයාගේ බලය පාවිච්චි කරලා නරක සුරංගනාවිගේ නරක ගතිගුණයි පුංචි සුරංගනාවිගේ නරක ගතිගුණයි අයින් කරලා දැම්මා. නරක සුරංගනාවි ඒ වෙලාවෙම විනාශ වුණා.

ඊට පස්සේ හොඳ කෙනෙක් වෙලා නරක සුරංගනාවි ආයෙමත් සුරංගනා ලෝකෙම ඉපදුණා. නරක සුරංගනාවියි පුංචි සුරංගනාවි හැමෝගෙන්ම සමාව ඉල්ලුවා. හැමෝම එයාලට සමාව දුන්නා. එයාලා හැමෝම සතුටින් ජීවත් වුණා.

නිමි...



# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ, ආර්ථික, පරිවර්තනයන් හේතුකොට ගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක